# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2273/78 - 2022 අප්‍රේල් මස 01 වැනි සිකුරාදා - 2022.04.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### වයඹ පළාතේ පළාත් සභාව

1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනත සමග කියැවෙන 1983 අංක 32 හා 1992 අංක 11 දරන සමූපකාර සමිති (සංශෝධන) පනත්වලින් සංශෝධනය වූ 1972 අංක 05 දරන සමූපකාර සමිති පනතේ 2 (2) උපවගන්තිය යටතේ විශේෂ ආඥාවක් අනුව සිදුකරන බලය පැවරීම

1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනත සමග කියැවෙන 1983 අංක 32 හා 1992 අංක 11 දරන සමූපකාර සමිති (සංශෝධන) පනත්වලින් සංශෝධනය වූ 1972 අංක 05 දරන සමූපකාර සමිති පනතේ 2 (2) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව වයඹ පළාත් ගරු ආණ්ඩුකාරවර අද්මිරාල් ඔෆ් ද ෆ්ලීට් වසන්ත කරන්නාගොඩ වන මම වයඹ පළාතේ සමූපකාර සංවර්ධන කොමසාරිස් සහ රෙජිස්ට්‍රාර්ට සහය වීමට පත්කර ඇත්තා වූ මීට අමුණා ඇති උපලේඛනයේ I වන තීරුවෙහි සඳහන් අයට 1983 අංක 32 හා 1992 අංක 11 දරන සමූපකාර සමිති (සංශෝධන) පනත්වලින් සංශෝධිත වූ 1972 අංක 05 දරන සමූපකාර සමිති පනත හා ඒ යටතේ පනවා ඇති රීති මාලාව යටතේ සමූපකාර සංවර්ධන කොමසාරිස් හා රෙජිස්ට්‍රාර් වෙත පැවරී ඇත්තා වූ එකී උපලේඛනයේ III වන තීරුවෙහි සඳහන් සියලුම බලතල එකී උපලේඛනයේ II වන තීරුවෙහි සඳහන් දින සිට මෙයින් පවරමි.

**අද්මිරාල් ඔෆ් ද ෆ්ලීට් වසන්ත කරන්නාගොඩ,**
වයඹ පළාත් ආණ්ඩුකාරවර.

2022 මාර්තු මස 21 වැනි දින,
කුරුණෑගල දී ය.



මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

උපලේඛනය

| *I වෙනි තීරුව* | *II වෙනි තීරුව* | *III වෙනි තීරුව* |
| --- | --- | --- |
| සූරියහෙට්ටි මුදියන්සේලාගේ සිසිර බණ්ඩාර | 2021.04.01 | සමූපකාර සමිති පනතේ 3, 5, 6, 7, 8, 9, 33, 39, 44 [44(6) හැර] 45, 46, 48, 49, 50, 52, 53, 54, 58 [58(3) සහ 58(5) හැර] 59, 68 සහ 72 යන වගන්ති යටතේ කොමසාරිස් හා රෙජිස්ට්‍රාර්වරයාගේ සියලු බලතල රීති මාලාවේ 4, 11, 15, 16(II) 18, 19, 27, 32, 33, 35, 37, 39, 40, 41, 42, 48, 49 [49(xii) හැර] 51, 52 සහ 53 දරන රීති යටතේ කොමසාරිස් හා රෙජිස්ට්‍රාර්වරයාගේ සියළු බලතල. |

EOG 04- 0001

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.